# බීවර් ගුහා චාරිකාව



ආර්.බී.ටී.සෙනාරා
රාජසිංහ

# බීවර් ගුහා චාරිකාව

ආර් . බී. තිසරි සෙනාරා රාජසිංහ

**බීවර් ගුහා චාරිකාව**

**ආර්. බී. තිසරි සෙනාරා රාජසිංහ**

චිත්‍ර සහ කතා - ආර්.බී.තිසරි සෙනාරා රාජසිංහ

ISBN අංකය - 978 – 624 – 208 – 135 – 9

දිනය - 2023.12.14

# පිදුම

මගේ ආදරණීය දෙමව්පියන්ටත්,

මෙම විද්‍යුත් පොත් ලිවීමට සහාය දුන් සැමටත්,

මගේ පාසලේ විදුහල්පතිනිය ඇතුළු ගුරු මණ්ඩලයටත්,

වචනයකින් හෝ මෙම පොත ලිවීමට සහය දුන් සැමටත්

ආදරයෙන් සහ ගෞරවයෙන්

පුදකර සිටිමි.

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

| පටුන | පිටු අංක |
| --- | --- |
| 01.ග්‍රීස්ම පාසල් නිවාඩුවේ ආරම්භය | 01 |
| 02.සිතුවිල්ලක් | 05 |
| 03.ගෙවත්තේ ආරම්භය | 09 |
| 04.රහසේම පැමිණි අමුත්තෝ | 12 |
| 05.මිතුරන්ගේ වූ ගෙවත්ත | 16 |
| 06.බීවර් ගුහා චාරිකාව | 19 |
| 07.වෘකයන්ගේ ආක්‍රමණය | 23 |
| 08.මිතුරන්ගේ පළමු වික්‍රමය | 27 |

# 01.ග්‍රීස්ම පාසල් නිවාඩුවේ ආරම්භය

"ලුවී මගෙ බෑග් එක දෙන්න!ඔයා මට පරක්කු කරන්නද හදන්නේ?"

"ඔයාගෙ බෑග් එක මම අතේ තියාගෙන ඉන්නවා වගේද පේන්නෙ! අහ් කියන්න.. අනික ඔයාට පරක්කු කරන්න මට කිසිම වුවමනාවක් නෑ, මොකද ඔයාට පරක්කු වෙනවා කියන්නෙ ම මටත් ඒ නිසා ම පරක්කු වෙනවා. අයියේ ඔයාට තේරුණාද?"

"හරි ,හරි, ලුවී මගේ බෑග් එක හොයන්න උදව් කරන්න. ප්ලීස්!."

ලුවී, විල්බර්ට් මේ මොකද මේ? ඔයාලා රණ්ඩු වෙනවාද?...මට කිවන් එකට ම ඇහුණා ඔයාලා කෑගහනවා!".

"මමී මෙයා බෑග් එක නැති කරගෙන මට දොස් කියනවා,දැන් ඒක හොයලා දෙන්නලු"

"අනේ! නෑ...නෑ... මම මෙයාගෙන් ඇහුවේ මගෙ බෑග් එක දැක්ක්ද කියලා විතරයි මමී ...

''හ්හ.. හ්හ.. හ්හ..හා.. මගේ පුංචි පැටියෝ, ඔයාගේ බෑග් එක මෙහෙ නම් නෑ.මට මතක විදිහට...ඊයේ හවස ඒක තිබුණේ...ඉස්තෝප්පු කාමරයේ බලන්න."

ලුවී සහ විල්බර්ට් යනු එක ම පවුලේ සහෝදරයින් ය.ලුවී පවුලේ බාලයා නැත්නම්, විල්බර්ට්ගේ නැගණිය යි.විල්බර්ට් යනු ඇගේ එක ම වැඩිමල් සොහොයුරා යි.ඔවුන් ජීවත් උනේ ස්ප්‍රින්ක් ෆීල්ට් නම් ගම්මානයේ ය.එය

මනරම් තනිතලා,දියඇළි,සානු,කපොලු,වනාන්තර ආදියෙන් පෝෂණය වුණු ප්‍රදේශයකි.ඔවුන් ජීවත් වුයේ තම මව,පියා සහ ආත්තම්මා සමඟ යි.

ඔවුන්ගේ පියා,එනම් ජෝන් මහත්මයා වෘත්තීයෙන් පශු වෛද්‍යවරයෙකි.මව එනම් එලීනා මහත්මිය රැකියාවක් වෘත්තිමය නොමැති වූවත් ඇය විශාල එළවළු සහ පලතුරු වත්තක හිමකාරියෙකි.ආත්තම්මාට ලුවී සහ විල්බර්ට් නැතිව කිසිදිනෙක සුළු මොහොතක්වත් සිටමට නොහැකියි. ඇයට විශේෂ බෙහෙත් සාප්පුවක් තිබුණි.නමුත් සීයාගෙ මරණත් සමඟ එම සාප්පුව ඇය විසින් වසා දමන ලදි. ඇය කාලයක් එම සිදුවීම නිසාවෙන් වේදනාවෙන් කාලය ගත කළා ය. ඒ කාලයේ ඇයට වඩාත් ලුවී සහ විල්බර්ට් සමීප වූ නිසාවෙන් මේ ආදරණීය බැඳීම ගොඩනැගිනි.

ඔවුන් ඉගෙනුම ලැබුවේ "ඊගල් මවුන්ටන්" පාසලෙනි.එම පාසල මෙම නමින් හැඳින්වීමට විශේෂ හේතුවක් ද තිබුණි. එය විශාල රාජාලියෙකුගෙ හැඩයෙන් යුත් ගිරි ශිඛරයක් මුදුනේ තනිව නැගී සිටි ආඩම්බරකාර පෙනුමකින් දිස් වීම මෙම නාමයට හේතුව විය. මෙය ග්‍රීස්ම නිවාඩුවේ ආරම්භක දිනයයි.උදෑසනින් ම අවදි වී පාසල වෙත ලහි ලහියේ යාමට සූදානම් වෙමින් සිටින අතරතුර මේ රණ්ඩුකාරි සංවාදය සිදු විය.කෙසේ හෝ උදෑසනින් ම පාසලට යෑම දෙදෙනාගේ ම ස්වභාවය වූ හෙයින් අද දිනයේදීත් ඔවුන් කල් වේලා ඇතිව ම පාසලට ගියහ. ග්‍රීස්ම නිවාඩුවට පෙර පාසල් යන අවසාන දිනය අද විය.එක් අතකින් නිවාඩු කාලය සතුටුදායක වූ නමුත් ,ඔවුන්ගේ නේවාසික මිතුරන් යලි පාසල ආරම්භ වන තුරු දැකීමට නොලැබීම දුකට හේතුවක් විය.
වේගයෙන් පැමිණි ජෝන් මහතාගේ වාහනය පාසලේ පහළ ගේට්ටුව අසලින් නතර කෙරිණි.විල්බර්ට් සහ ලුවී දෙදෙනා ම වාහනයෙන් බැස ජොන් මහතාට සමු දී පාසල වෙත ඉකමනින් ඇතුළු විය.

එවිට ඔවුන් දුටුවේ ළමුන් සුපුරුදු පරිදි කටයුතුවල නිරත වන බවය.ඉන් පසු විල්බර්ට් තම පන්ති කාමරය වෙත්ටත්, ලූව් ඇයගේ පන්ති කාමරය වෙතටත් ඇදී ගියහ.සුළු මොහොතකින් සීනුව නාද විය.



පාසලේ නොයෙක් තැන්වල සිටි සියලු ම ළමයි පන්ති කාමර වෙත පැමිණියහ. සෑම දිමක ම උදෑසනින් ම විදුහල්පතිනිය නිවේදනයක් ලබා දෙයි."සුබ උදෑසනක් සියලු ම දෙනාට! අද අපේ පාසලට වගේ ම මෙම ප්‍රදේශයේ සියලු ම පාසල්වලට සුවිශේෂී දිනයක්.එයට හේතුව මේ වර්ෂයේ ග්‍රීස්ම නිවාඩුව හෙටින් ආරම්භ වෙනවා.එම නිසා අද දින පාසලෙන් විශේෂ උත්සවයක් අපි අපේ දරුවන්ට පවත්වන්නට තීරණය කළා.සියලුම සිසු සිසුවියන් පාසල් ප්‍රධාන ශාලාව වෙත පැමිණෙන්න.ස්තූතියි." මේ පාසලේ ස්පීකර් සියල්ලෙන් ම ඇසුණු විදුහල්පතිනියගේ හඬයි. ඒත් සමඟ ම එකවර ම නැගුණු ළමුන්ගේ ප්‍රීති ඝෝෂාව පාසල දෙවනත් කරන්නට සමත් විය.

ප්‍රධාන ශාලාව ඉතා උත්කර්ෂවත් අන්දමින් සරසා තිබෙණු දක්නට ලැබුණි.සියලු ම ළමුන් සතුටින් කාලය ගත කළ අතර මෙම උත්සවය අවසානයේ නේවාසික සිසුන්ගේ දෙමව්පියන් ද එයට සහභාගී වූහ.කෙමෙන් කෙමෙන් කාලය ගෙවුණි.ගුරුවරුන් විසින් සිසු සිසුවියන්ට ඔවුන් විසින් ම

සාදන ලද අපූරු රෙදි මල් තිළිණ කෙරිණි.සතුටුදායක පාසල් දිනය නිමාවිය.සිසුන් තම මිතුරන්ගෙන් සහ ගුරුවරුන්ගෙන් සමු ගෙන තම නිවෙස් බලා යන්නට විය.

මේ අතරතුර එලීනා මහත්මිය සහ ජෝන් මහතාත් ලුවී සහ විල්බර්ට් වෙනුවෙන් පාසල් ගේට්ටුව අසල රැඳී සිටියහ.ලුවීත් විල්බර්ටවිල්බර්ට් සමඟ තම නිවස කරා යන්නට විය.



# 02.සිතුවිල්ලක්

ආත්තම්මා ඔවුන් එනතුරු මග බලා සිටින අයුරු ඈත සිට ම එන ඔවුන්ට මනා ලෙසින් පෙනුණි.කඩිමුඩියේ වහනයෙන් බැස ගත ලූවීත් විල්බර්ට් සමඟින් ආආත්තම්මා ළගට දිව ගියා ය.ආත්තම්මා ඔවුන් තුරුළු කර ගත්තා ය."මගේ චෝටි නෝනයි මහත්තයායි දැන් මූණ හෝදලා අලුත් ඇඳුමක් ඇඳලා මගෙ ළගට එන්නකෝ,මගේ ළග පුංචි තෑග්ගක් තියෙනවා ඔයාලට දෙන්න."ආත්තම්මා කීවාය ."අනේ ආත්තම්මෙ මොකක් ද ඒ කියන්න"ලූවී පැවසුවා ය." හා..හා.. හා… ලූවී අපි බලමු ඒ තෑග්ග කවුද ගන්නෙ කියලා," ඒ මෙතෙක් වේලාවක් නිහඬව සිටි විල්බර්ට්ගේ කටහඬ ය.එක පිම්මෙ ලූවී ගෙතුළට දිව ගියා ය.එත් සමඟ ම විල්බර්ට් ද දිව ගියේ ය.

සුළු මොහොතකින් පසු ලූවීත් විල්බර්ටුත් පහළ මහලට පැමිණියහ.එහි ආත්තම්මා දක්නට නොවීය.ගේ පුරාම ඇවිද බැලූවිට ද ඇය එහි නොවී ය.මවත් පියාත් නැවත්තත් වැඩ සඳහා නිවසින් පිටතට ගිය නිසා ඔවුන් ද ගෙදර නොවීය.පසුව ඔවුන් මවගේ එළවළු පාත්තිය වෙතට දිව යන්නට විය. ඔහ්!ආත්තම්මා ඔව් ඇය නිවස අසල ඇති කුඩා විල අසබඩ පාලම ළග හිදගෙන සිටිනවා ඔවුන්ට දැකගන්නට හැකි විය."ආත්තම්මා,ඇයි මේ කවදාවත් නැතුව මෙතනට වෙලා?"විල්බර්ට් ඇසුවේ ය."ඒකනේ අපි මේ හැමතැන ම ආත්තම්මව හෙව්වා.",ඒ ලූවී ය.නමුත් ඇය කිසිවක් පැවසුවේ නැත.ළමුන් දෙදෙනා ඇයගෙ දෙපසට වී හිදගත්හ.මද නිහැඩියාවක් ඇති විය.සුළු මොහොතකින් මේ නිහැඩියාව බිදිමින් ,"ඔය ළමයි දන්නවද? සීයා හිටපු කාලෙ කොයි වගේද කියලා" ආත්තම්මා පැවසුවා ය.
"ම්..ම්..අපි නම් දන්නේ ඒ කාලෙ ආත්තම්මාලා අර වහලා තියෙන සාප්පුවේ වැඩ කලා කියලා තමා."

"ඔව් ඒකාලේ ඒක බොහොම හොඳ බෙහෙත් සාප්පුවක්ලු නේද?"

"පුතාලා දන්නෙ ඒ සාප්පුව ගැන විතරයි නෙ!"

"ඇයි ඒ කාලෙ කොයි වගේද ?"

"මේ පුංචි විලට එහා පොඩි හිස් බිමක් පුතාලට පේනවා නේද?"

විල්බර්ට් සහ ලුවී ඈත හිස් බිම් කොටස දෙස දෑස් අයාගෙන සිටියහ.

"ඒ කාලෙ ඒ තැන හරි ම ලස්සනයි."

"මායි සීයායි එකතු වෙලා හදාපු පුංචි ගෙවත්තක් එතන තිබුණා,සාප්පුව වගේ ම එකත් විනාස වෙලා ගියා පුතේ!.."

මේ සියල්ල අසා සිටි විල්බර්ට්ගේ සිත වෙනදාට වඩා අමුතු ස්වභාවයක් ගෙන ඇති බව ඔහුට ම වැටහිණි.ඉන්පසු තමා හිඳගෙන සිටි ස්ථානයෙන් වහා නැගිටි ඔහු එතැනින් වේගයෙන් දිව ගියේ ය.ඒ සියල්ල දෙස ලුවී කිසිවක් නොතේරෙන අයුරින් ආත්තම්මාගේ දුක් මුසු මුහුණ දුටුවා ය. තවත් සුළු මොහොතකින් "ස්ස් ස්ස් ඒයි මෙහෙ එනවා!"රහසින් කවුරුන් හෝ කතා කරන  අයුරු ලුවීට ඇසෙන්නට විය.ඔව් විල්බර්ට් ඇයට එතැනින් පැමිණෙන ලෙසට සංඥා කළේ ය.විල්බර්ට්ගේ හදිසිකාරි මැහුණ දුටු ලුවී ද එතැනින් වහා විල්බර්ට් වෙත ගියා ය.

සුළු මොහොතකින් යළිත් ආත්තම්මාගේ දෙපසට පැමිණි ඔවුන් මෙවර පැමිණ ඇත්තේ නම් තනිව නොවේ.ඔවුන්ගේ දෑත් වල උදලු,පස් බුරුල් කරන ආයුද,මල් බාල්දියක් සහසවලක් ද විය.එය දුටු ආත්තම්මාගේ දෑස් අදහාගත  නොහැකි විය."අපි හිතුවා ආයෙත් පුංචි ගෙවත්තක් හදන්න.",ඒ විල්බර්ට් ය."ඔව් දන් නිවාඩු හින්දා අපිට හොඳ පුංචි ගෙවත්තක් හදන්න මේ නිවාඩුව  උදවු කරයි.",ඒ ලුවී ය. ආත්තම්මාගේ මුවට එක වර ම සෞම්‍ය සිනහ රැල්ලක් ගෙන දෙන්නට ඒ වදන් වලට හැකි විය."ඒත් පොඩි අවුලක් නම් තියෙනවා!,අපි ඇත්තට මොනවාද හදන්නෙ මේ අපෙ අනාගත පුංචි ගෙවත්තේ?" ඒ ලුවීගේ කටහඬ ය.මෙතෙක් වේලා තම දෑතෙ ගුලි කරන්

තියාගෙන සිටි ඒ පුංචි බීජ පැකට්ටු දෙක  ආදරයෙන් ළමුන් දෙදෙනාගෙ දෑතින් තැබූ ආත්තම්මා,"පුතාලාට පුලුවන් නම් අපි හෙට ම අපේ පුංචි ගෙවත්ත හදමු ද?"

"ඒක නම් හොඳයි අපි නම් අද වුණත් ලෑස්ති ආත්තම්මා..."

" එහෙනම් මගේ චූටි නෝනයි මහත්තයායි හෙට ඉඳන් වැඩ පටන් ගමු"යළිත් වරක් ආත්තම්මා ලූවී සහ විල්බර්ට් තම දෑතින් වැළඳ ගත්තා ය.සුළු මොහොතකින් අම්මාත් තාත්තාත් ඈත සිටම වාහනයෙන් එනු දුටු ඔවුන් ගෙදර ඉදිරිපසට පැමිණියහ.සියල්ලෝ ම සතුටින් නිවස ඇතුළට ඇදී ගියහ.සවස ආත්තම්මාගේ රස කතාන්දරයකට සවන් දුන් සියලු දෙනාම රාත්‍රී භෝජනයෙන් පසු නින්දට ගියහ.

නමුත් ලූවීටත් විල්බර්ට්ටත් නින්ද ගියෙ නම් ඒ ඔවුන් ඔවුන්ට රහසේ ම තබා ගත් ප්‍රතිපත්තිය යළිත් වරක් සිහිපත් කරමිනි.ඒ 'ආත්තම්මා සීයා සිටින කාලයේ සතුටින් රැකබලාගත් ගෙවත්තට වඩා හොඳ ලස්සන ගෙවත්තක් යළිත් ආත්තම්මට ලබා දිය යුතුයි' යන ප්‍රතිපත්තිය යි.සිතේ තිබුණු දැඩි ප්‍රතිපත්තිය නිසා ම ඔවුන් තුළ මනා උද්‍යෝගයක් ද හටගන්නට



විය.ආත්තම්මාගේ අපූරු ත්‍යාගය ඔවුන්ව මේ නිවාඩුව කාලය පුරා ම සතුටින් තබනු ඇති.ආත්තම්මාගේ අපූරු තෑග්ග වූවේ බීජ පැකට්ටු දෙක යි.එය ඔවුන් ඉතාමත් ප්‍රීතියෙන් තැබිය හැකි ක්‍රියාශීලී ක්‍රීඩාවක් බඳු විය හැක.මේ බලාපොරොත්තු රැසක් සමඟ ඒ දිනය නිමා වී ගියේ ය.

# 03.ගෙවත්තේ ආරම්භය

අලුත් දිනයක් අලුත් වැඩක්. එය තණ අග පිනි බිංදු රුරා වැටෙන,විලේ ජලය හිරු රශ්මියෙන් බබළන,කිචි බීචි කුරුලු ගී නද දසත පැතිරෙන චමත්කාරජනක ප්‍රබෝධමත් උදයක් විය.සැමට කලින් අවදි වුණු ලුවී කෙමෙන් කෙමෙන් විල්බර්ට් කාමරයට ඇතුළු වූවා ය.

"ඒයි...මේ... නැගිටින්න... ඉතින් කෝ! නැගිටින්න...",ලුවී විල්බර්ට්ව සොලවන්නට විය.

ඉතාම අමාරුවෙන් නැගිටගත් විල්බර්ට්ගේ මුවින් එක වරම පිට වූයේ "ගුඩ් මෝර්නින්ග් පිස්සි!,අද උදේම නැගිට්ටද ?",කියායි.

ලුවීත් "ගුඩ් මොර්නින්ග් අයියේ! ඒත් ඔය දැන් ම මූණ හෝදලා පහළට ආවෙ නැත්නම් අනිත් අයට කියන්න වෙන්නෙ,ගුඩ් ආෆ්ටර්නූන් කියලා තමා", යැයි පැවසුවා ය.

ඉන්පසු දෙදෙනා ම මුහුණ සෝදා,අලුත් අලුත් ඇඳුම් ඇඳලා පහළ මහලට යන්නට විය.ඔවුන් දුටු අම්මා පළමුවෙන්ම පැවසුවේ,"අනේ මගෙ පැටවු දෙන්නා කවදාවත් නැතුව මොකෝ මේ කලින් ම ලැහැස්ති වෙලා ?මම දැනුයි

ඔයාලාගේ තෙ දෙක හදලා ඉවර කළේ!"කියා ය.

ඔවුන් දෙදෙනා උදෑසනින් ම අවදි වී සිටින අයුරු දුටු තාත්තාත් පුදුම විය.නමුත් ආත්තම්මා එහි නොවීය.

"ගුඩ් මෝර්නින්ග් තාත්තා,ගුඩ්මෝර්නින්ග් අම්මා"මේ ඔවුන් දෙදෙනාගේ එක වර නැගුණු හඬයි.ඔවුන් අම්මා පිලියෙළ කර තිබුණු උදේ කිරි එක බටර් මැදින් තැවරූ පාන් පෙත්තක් ද අහරට ගනිමින් බිව්වෝහ.ඉන්පසු ගෙවත්තක් සැකසීමට අවශ්‍ය බඩු එක් රැස් කර ගැනීමට ගිය ඔවුන් ආත්තම්මා දුන් බීජ පැකට්ටු දෙක ද අතට ගත්හ.ඒත් ආත්තම්මා එහි නොවීය.ඇය ගෙවත්තක්

සැදීමට අවශ්‍ය සැලැස්මක් නිර්මාණය කර තිබුණි.එය ද රැගෙන ඇය ළමුන් සොයා ගෙවත්තක් සැදීමට කතිකා කරගත් බිම් කොටසට පැමිණියා ය.

"ආත්තම්මව අපි හැමතැනම හෙව්වා.ඊයේ වගෙ අදත් අතුරුදන් වෙලා කියලා හිතුවෙ",විල්බර්ට් පැවසුවේ ය.

"පුතේ මම මේ ගෙවත්ත හදන්න සැලැස්මක් හැදුවා.ඉතින් දැන් වැඩෙ ලෙහෙසියෙන් කරන්න පුලුවන්."

"අපි දැන් ම වැඩේ පටන් ගනිමු"ලුවී කිවා ය.


එයට එකග වූ සියලු දෙනාම පුංචි බිම් කොටසට පැමිණියහ.උසට වැඩී තිබූ පඳුරු ගලවා දමා,උදැල්ලෙන් බිම කොටන්නට විය.එහි තිබී ඔවුන් නොදැනුවත්ව ම හොඳින් වැඩී තිබුණු වට්ටක්කා වැලක් ඔවුන් හමුවිය.එය විශාල ආශ්චර්යයකි.බොහෝ සතුටට පත් වූ ඔවුන් යළිත් වැඩ පටන් ගත්හ.කෙටි විවේකයක් සදහා නිවසට ගිය ඔවුන් විස්කෝතු කිහිපයක් ගිල දමා වතුර ටිකක් බී යළිත් වැඩ පටන් ගත්හ.

කෙමෙන් කෙමෙන් කාලය ගෙවී ගොය අතර බිම් කොටස ද කෙමෙන් කෙමෙන් එළිය විය.සන්ධ්‍යා කාලය එළඹෙත් ම සියලු දෙනාම සතුටු කරවමින් එක් පසක ගලවා දැමූ පඳුරු,වැල්, පැළෑටි ද අනෙක් පසින් වට්ටක්කා වැලත් අනර්ගව එළි පෙහෙළි වී ඇති භූමියත් දැක ගත හැකි විය.එහෙයින් සෑහිමකට පත් නොවූ ඔවුන් උදුරා දැමූ වල් පැළෑටි පුලුස්සා දැමූහ.

ඉන් පසු සියල්ලෝම නිවසට ගොස් ඇගපත් සෝදා ගෙන රාත්‍රී භෝජනයට සූදානම් වූහ.

ඒ අතරේ ලුවී සහ විල්බර්ට් තම දින සටහන් පොතේ එදින ඔවුන් ගෙවූ ක්‍රියාශීලී දවස ගැන ලියන්නට විය.එය අපූරු පිටුවකි ඔවුන්ගේ දින සටහන් පොතේ.අම්මත් තාත්තාත් මේ අරුම පුදුම ගෙවත්ත පිළිබඳව කිසිවක් දැන සිටියේ නැත.ඔවුන් දෙපළට නොසිතූ අයුරින් තම වැඩ රාජකාරි බහුල

විම.මෙයට හේතුවයි.රාත්‍රී භෝජනයෙන් පසු සුපුරුදු පරිදි සියල්ලෝම නින්දට ගියහ.මවත් පියාත් ඔවුන්ගෙන් සැගවූ තවත් රහසක් එහි විය.



# 04. රහසේම පැමිණි අමුත්තෝ

මේ උදෑසන පෙර දිනයේ උදෑසනට වඩා සහමුලින්ම වෙනස් උදයකි.අදත් ලුවීත් විල්බර්ටුත් අවදි වූයේ ඊයේ අවදි වුණු වේලාවට ම ය.නමුත් අද ඔවුන් පරක්කුයි.වහා ම පහළ මහලට පැමිණි ඔවුන් දුටුවේ කලබලකාරි පරිසරයකි.

"ගුඩ් මෝර්නින්ග් තාත්තා, ගුඩ් මෝර්නින්ග් අම්මා,ආත්තම්මා ගුඩ් මෝර්නින්ග්!"මේ ඔවුන් දෙදෙනාගේ හඩයි.

"ගුඩ් මෝර්නින්ග් පැටියෝ"මේ වැඩිහිටියන්ගේ හඩයි.

"අම්මා ඇයි මේ කලබලෙන් කෑම හදන්නේ?"

"තාත්තා ,ආත්තම්මාත් එක්ක එකතුවෙලා හදිසියේම ගෙදර අස් කරනවා.ඒක නම් හොඳයි.ඒත්!..ඇයි මේ?"

මෙය ලුවීගේත් විල්බර්ට්ගේත් එක ම පැනය යි.

"පුතා විල්බර්ට් ඔය ග්‍රැමෆෝන් එක ළග තියෙන ලියුම බලන්න."ඒ තාත්තාගේ පිළිතුරයි.

ලුවී කලබලකාරි අන්දමින් ලියුම අත්ට ගත් නමුත් ඇය අයියා ඔයාම කියවන්න කියා ලියුම විල්බර්ට් අතට දුන්නාය .

ආදරණීය ජෝන් මහතා ඇතුළු පවුලේ සැමට,

මෙය ඔබ සැමට මතක ආවර්ජනයක් සහිත ලිපියක් විය හැක.පසුගිය ශීත ඍතුවේ දී අප වෙන් වී යන්නට සූදානම් වී සිටි මොහොතේ ඊළඟ නිවාඩුව ගත කිරීමට අප ඔබලාගේ නිවසට පැමිණෙන බව කීවා ඔබේ මතකයේ ඇති යැයි සිතමු.හිදින් මේ කුඩා ලිපිය ලියන්නෙ ඒ දිනයේ පැවසූපරිදි අපි සියලු දෙනාම ඔබේ නිවසට පැමිණීමට නියමිතයි.එදින කතිකා

කරගත් පරිදි නිවාඩුව ලැබී දින දෙකකින් අපි පැමිණීමට සූදානම් ය.මේ ලිපිය ඒ පිළිබඳව ලියූ ලිපියකි.

මේ,

ආදරණීය

ෆෙඩ්‍රික් ඇතුළු පවුලේ සැම

වෙතින්

ඔවුන් කියවූ මේ ලියුම ළමුන් අතිමහත් සතුටකටත් උද්‍යෝගයකටත් පත් කළ අතර එහි විශේෂත්වය වූවෙ ඔවුන්ගේ මිතුරන් වූ ඩොනල්ඩ් ,කැල්වින් සහ ෆියෝනා යන අය ද යළිත් වරක් හමුවිය කැකි නිසා ය.පසුගිය ශීත ඍතුව මොවුන් ගත්කළේ ෆෙඩ්‍රික් මහතාගේ නිවසේ ය.

ලූවීත් විල්බර්ටුත් සමඟ වැඩිහිටියන්ට ගෙදර සූදානම් කරන්න උදවු කළහ.ලූවී ඇයගේ කාමරය වෙනදාට වඩා අපූරු අයුරින් දිස්වෙන පරිදි සැකසූ අතර විල්බර්ට් ජෝන් මහතා සමඟ තවත් ඇදක් විල්බර්ට්ගේ කාමරයට දැමුවේ ය.ඒ කැල්වින් සහ ඩොනල්ඩ් යන දෙදෙනාට ම ඔහුගේ කුටිය සූදානම්ව තැබිය යුතු නිසායි.ලූවී වඩාත් අලංකාර අයුරින් තම කුටිය සැකසූවේ තම මිතුරිය වන ෆියෝනා සමඟ මේ නිවාඩුව පුරාම ඇයගේ කුටිය බෙදා ගත යුතු හෙයිනි .

සුළු මොහොතකින් ගේට්ටුව පැත්තෙන් වාහනයක ශ්බ්දයක් ඇසෙන්නට විය. නොඅනුමානය ඒ ෆෙඩ්‍රික් පවුලේ රථයයි.ඔව් සැබැවින්ම ඔවුන් පැමිණ

ඇත.මුලින් ම ජෝන් මහතා ෆෙඩ්රික් මහතාගේ වාහනය නැවතීම සඳහා ස්ථානය පෙන්නුවේය.රථයෙන් බැසගත් ෆෙඩ්‍රික් මහතා ඇතුළු පවුලේ සැම, පිළිගැනීමට ජෝන් මහතා සහ වයලට් මහත්මියත් ,ලූවී සහ විල්බර්ටුත්,ආත්තම්මාත් ඉදිරියට පැමිණියහ.

ඉදිරියෙන්ම ගිය ජෝන් මහතා ෆෙඩ්‍රික් මහතා මහතාගේ අතින් අල්ලාගෙන සුහදව ඔවුන්ව පිළිගත් අතර, වයලට් මහත්මිය කැතලින් මහත්මියවත්,ලුවි තම ආදරණීය මිතුරිය ෆියොනා වත් , විල්බර්ට් ඔහුගේ මිතුරන් වන ඩොනල්ඩ් සහ කැල්වින්වත්, ආත්තම්මා ඇයගේ පරණ හොඳම මිතුරියක් වන ෆෙඩ්රික් මහතාගේ මවත් ආදරෙන් පිළිගත්හ .

සියලු දෙනාම නිවස ඇතුලට පැමිණි අතර,සැප දුක් විමසූ ඔවුනොවුන් පසුව වයලට් මහත්මියගේ විශේෂ තේපානය භුක්ති වින්දහ.කාලයකට පසු තමන්ගේ මිතුර මිතුරියන් හමුවූ ලුවී සහ විල්බර්ට් තමන්ගේ තොරතුරු ඔවුන් සමග බෙදාගත්හ. පසුව වයලට් මහත්මිය කැතලින් මහත්මියව තම එළවළු වගාවන් සහ පළතුරු වගාවන් වෙත රැගෙන ගිය අතර,ජෝන් මහතා ෆෙඩ්‍රික් මහතා සමග තම අලුත් වාහනය වෙත ගියහ. ආත්තම්මා තම මිතුරිය සමඟ ඔවුන්ගේ අතීතය පිළිබඳව මතක ආවර්ජනයක් කළා ය. ඒ අතර ලුවි තම මිතුරිය ෆියෝනාත් සමග ඇයගේ අලුත් නිර්මාණ එකතුව වෙත ගියා ය.කිසිදු විශේෂ කටයුත්තක් නොතිබූ පිරිමි ළමයි තිදෙනා, විල්බට්, ඩොනල්ඩ් සහ කැල්වින් ආත්තම්මා සහ ලුවි සමග සෑදීමට ආරම්භ කළ ගෙවත්ත වෙත ගියහ.

මේ අයුරින් ටික වේලාවක් කතිකා කරමින් සිටි ඔවුන්,සියලු දෙනාම යළිත් නිවස වෙත කෙමෙන් කෙමෙන් පැමිණියහ .ඒ වනවිට ආත්තම්මාත් ෆියෝනාගේ ආතම්මාත් දවල් ආහාරය සූදානම් කර තිබූහ.දවල් ආහාරය ගත් ඔවුන්තම තමන්ගේ වැඩ කටයුතු වලට පිටව ගියහ.ඉන්පසු නිවස ඉතිරි වූයේ ආත්තම්මලා දෙදෙනා සහ ළමයින් පස් දෙනා පමණයි.අත්තම්මලා දෙදෙනා අලුත් ගෙතිම් ක්‍රමයක් ගැන කතිකා කරමින් සිටින, ලුවි සහ විල්බර්ට් ඔවුන්ගේ මිතුරන් සමග අලුත් ගෙවත්ත වෙත ගියහ.ගෙවත්ත ඉතිරි වී ඇති වැඩකටයුතු කිරීමට මහත් ආශාවක් තිබුණු,ළමුන් පස්දෙනා ම අද ගෙවත්තේ වැඩ කටයුතු කිරීමට සූදානම් වූහ.නමුත්මිතුරන්ට ගමන් මහන්සේ

නිසාවෙන් ඒ වැඩ කටයුතු ඊළඟ දවසට කල් දැමුණි.ටිකෙන් ටික රෑ බෝවීගෙන එන නිසා සියලු දෙනාම යළිත් නිවස කරා පැමිණියහ.ෆෙඩ්රික් මහත්මා සහ කැතලින් මහත්මිය ආගන්තුකයන් සඳහා වෙන් වූ කාමරයේත් ෆියෝනා ලුවීගේ කාමරයේත්,කැල්වින් සහ ඩොනල්ඩ් විල්බර්ඩ්ගේ කාමරයේත්,ඇඳවල් දෙකකින් සමන්විත වූ ආත්තම්මාගේ කාමරයේ පියෝනාගේ ආත්තම්මත් රාත්‍රී නින්දට ගියේ ඉතාමත් මිහිරි රාත්‍රී භෝජනයෙන් පසුවයි.

ඒ රාත්‍රී භෝජනය අතරතුරු දේ කතා කරගත් පරිදි ෆෙඩ්රික් මහත්මයාත්, කැතලින් මහත්මයත් ඊළඟ දිනය උදෑසනින්ම ඔවුන්ගේ නිවසට පිටව යයි .එවිට ජෝන් මහතාගේ නිවසේ ෆියෝනා, ෆියෝනාගේ ආත්තම්මා ,ඩොනල්ඩ් කැල්වින් යන තිදෙනාම නවතිනු ඇති.තවත් මෙහි අමුතුම රහසක් විය.නමුත් ඒ රාත්‍රී භෝජනයේදී දෙමාපියන් එය සියලු දෙනාටම පැවසූහ.ඒ ඔවුන අනිද්දා දිනයේදී බීවර් ගුහා නැරඹීමේ චාරිකාවකට යෑමයි.එය දරුවන්ගේ සිත් තුළ සතුටක් සහ දුකකුත් ඇති කළ කරුණක් විය.එයට හේතුව වූයේ ඔවුන් මේ නිවාඩුවම ගෙවත්ත සමග ගත කිරීමට සිතාගෙන සිටි නිසයි.නමුත් කම් නොවේ බීවර් ගුහා නැරඹීමේ චාරිකාව එක් දිනයකට පමණක් හෙදිය ඇති හෙයින් තවත් සතුටට කරුණක් බවට පත්විය.

දරුවන් සතුටින් සිටියේ ඔවුන්ට තවත් එක් දිනක් තුළ බීවර් ගුහා නැරඹීමට පෙර ගෙවත්ත සැකසීමට අවස්ථාව හමුවන නිසයි.ආත්තම්මා විසින් ලුවීටත් විල්බර්ටත් දුන් බීජ පැකට්ටු ඔවුහු ඔවුන්ගේ මිතුරන් සමග බෙදා ගත්හ. පසුව සුබ යැයි සුබ පැතීමෙන් පසු සියලු දෙනාම නින්දට ගියහ.

# 05. මිතුරන්ගේ වූ ගෙවත්ත

උදෑසනින්ම අවදි වූ මිතුරන් ඉක්මනින්ම කාටත් නොදෙවෙනි වෙන පරිදි පහළ මහලට පැමිණියහ.ෆෙඩ්රික් මහත්මයා සහ කැතලීන් මහත්මිය තමන්ගේ නිවෙස් වලට යාමට සූදානම් වී සිටියහ.උදෑසන ආහාරය රැගෙන තිබූ ඔවුන් තමන්ගේ දරුවන්ට එනම් ෆියෝනාටත්, ඩොනල්ටත්,කැල්වීටත් සමු දුන් අතර ජෝන් මහතාගේ පවුලේ සැමටත්, ඔවුන්ගේ ආදරණීය අම්මා එනම් ෆියෝනාගේ ආත්තම්මාටත් සමුදුන්හ.මේ අයුරින් ඔවුන් දෙපළට ඉතාමත් ඉක්මනින් සමු ගැනීමට සිදුවූයේ පිටරට විශේෂ සංචාරයක් සඳහා යෑමට තිබූ නිසායි.

ඉන්පසු සියලු දෙනාගේම සමගත් ඔවුන් දෙපළ තම වාහනයට නැගෙයි යළිත් ඔවුන්ගේ නිවෙසබලා ගියහ.මිතුරන් පස්දෙනාම එක් වී ගෙවත්තේ වැඩ කටයුතු ආරම්භ කිරීමට සූදානම් වූහ. ඊට ප්‍රථම සියල්ලෝම උදේ ආහාරය ගත්හ. දෙමාපියන් දෙදෙනා ඔවුන්ගේ වැඩපළවල් වෙතත්,ආත්තම්මලා ඔවුන්ගේ

ගෙතින් පාඨමාලාව වෙතත් ඇදී ගියහ.අවසානයේ ඉතුරු වූ මිතුරන් පස්දෙනා අවශ්‍ය කරන සියලු උපකරණ රැගෙන ආඩම්බරකාරි ලීලාවෙන් උද්යෝගයෙන් අති මහත් සතුටකින් ගෙවත්ත සෑදීමට නියමිතව තිබූ බිම් කොටස වෙත ගියෝය. තවත් හොඳින් බිම කෙටූ ඔවුන්,අවට පරිසරය තව තවත් සුද්ද පවිත්‍ර කළහ. ස්වල්ප වශයෙන් ජලය ඉස, කෙමෙන් කෙමෙන් බීජ සිටුවීමට අවශ්‍ය ප්‍රමාණයේ සිදුරු සාදමින් බීජ සිටවා අවසන් කළහ. එය ඉතාමත් උද්‍යෝග්‍යමත් ක්‍රියාශීලී උදෑසනක් විය.උදේ පහව ගොස් දවල් වන

විට නිවස වෙත ඔවුන් දැත් අතපය සෝදාගෙන ආවේ ඔවුන්ට බඩගින්නක් දැණුන නිසාවෙනි.

ඒ වන විට ආත්තම්මලා සුවඳ හමන දවල් ආහාරයක් සකස් කර තිබුණි.එය සතුටින් ආහාරයට ගත් මොවුන් සුහද කතාබහක නිරත වූහ.'ඒ අතරතුර කුමක් හෝ යළිත් දෙයක් සිද්ධ කිරීමට තිබෙනවා නම් ගෙවත්තක් සාදනවාට අමතරව!'එය ඔවුන්ගේ කතිකාවේ මාතෘකාව විය. නැහැ එවැන්නක් දැන්මම අවශ්‍ය නොවන බව ඔවුන්ගේ අදහස විය.ඒ ඔවුන්ට හෙට දිනයේ දී අනිවාර්යෙන්ම බීවර් ගුහාවේ චාරිකාවට යාමට සිදුවන නිසාය.ආහ්…දැනුයි මතක් උනේ,බීවර් ගුහාවේ චාරිකාවට ඔවුන් සූදානම් විය යුතුයි.වහාම තමන්ගේ කාමර වෙත ගිය ඔවුන් තමන්ට අවශ්‍ය බඩු මල්ල සූදානම් කරගැනීමට කටයුතු කළහ.නොබෝ වේලාවක් යාමට ප්‍රථමයෙන් ඔවුන්ගේ සිදුකළ අවසන් විය.මෙවැනි චාරිකා යාම සාමාන්‍ය දෙයක් නිසා එවැනි කාර්යයක් සිද්ධ කර සිටීම එනම් බඩුමල්ලක් සාදා ගැනීම යනු ඔවුන්ට සුළු කාරියකි.

කෙමෙන් කෙමෙන් දවාල සන්ධ්‍යාවට පෙරළී ගිය අතර,යළිත් වරක් ගෙවත්ත වෙත යා යුතු බව ඔවුන්ගේ අදහසයි.කුඩා පින් ප්‍රදේශයක් කීවත් ඔවුන් යළි ඒ සුද්ද පවිත්‍ර කළ නිසා ඒ ඉතාමත් විශාල භූත ප්‍රදේශයක් යැයි පොඩි ළමයෙකුට කිව හැක.සාමාන්‍යයෙන් මීටර් හතක් හයක් වගේ ප දිග පළලකින් යුක්ත වූ මෙය අනර්ඝව දිස්විය.කුඩා මල් බඳුන්වලින් ඉතාමත් ස්වල්ප වශයෙන් බීජ වලට කිසිදු හානියක් නොවන අයුරින් මිතුරන් සියලු දෙනාම එක්ව ජලය ඉසින්නට විය.තම තමන්ටම වෙන් වූ දිනපොත් තිබූ ඔවුන්,තම දිනපොත් වල අද දිනය ගතකළ අයුරුත් ඊයේ දිනය ගත කළ අයුරුත් ලියන්නට විය.පුංචි

ගෙවත්ත පිළිබඳව පළමුවෙන්ම ලියන ආගන්තුක මිතුරක් තිදෙනා එය ලීවේ ඉතාමත් නැවුම් ස්වභාවයකිනි.එයට හේතුව "ඔවුන්ද දැන් ගෙවත්තක හිමිකාරයන් වීමටයි යන්නේ! ඔවුන් අතින්ම ගෙවත්තන් නිර්මාණය වෙනවා." යැයි ඔවුන්ට හිතා ගැනීමටත් නොහැකි විය.

සුපුරුදු පරිදි වැඩපළවල් වලින් නිවසට පැමිණි දෙමාපියන් දුටු ළමුන් මේ වෙත ඇදී ගියේ ඊළඟ දිනයාමට නියමිත චාරිකාව සඳහා කුමක් හෝ විශේෂ දෙයක් ඔවුන් ගෙන තිබෙනවාදැයි බැලීමටයි.සත්‍ය වශයෙන්ම විශේෂ දෙයක් එහි විය.ඒ අලුත් කූඩාරම් කිහිපයකි. ඒ නිවසේ තිබූ කූඩාරම් ගරා වැටීනිසාත් ඒවාත් පරණ නිසාත් ගෙනා අලුත් කූඩාරම් ය.සුපුරුදු පරිදි රාත්‍රී භෝජනයෙන් පසු යළිත් නින්දට යන්නට වූ සියලු දෙනාම බලාපොරොත්තුවෙන් සිටියේ ඊළඟ දිනය උදාවන තුරුය.



# 06.බීවර් ගුහා චාරිකාව

උදෑසනින්ම අවදි වූ නිවසේ සියල්ලෝම යාමට නියමිතව තිබූ චාරිකාව සඳහා ඉතාමත් උද්‍යෝගයෙන් උනන්දුවෙන් සූදානම් වෙමින් සිටියහ.එය මහත් විනෝද කාමය චාරිකාවක් විය හැක.යහළුවන් පස්දෙනාම එකතුවී, මේ ඔවුන් යන වනගත චාරිකාවල පළමු චාරිකාවයි.

"ලුවි පියුනා ඔය දෙනම ඔයාලට ඕන කරන බඩු ඔක්කොම ගත්ත නේද?" සියල්ලන්ගේම අයියා වන ඩොනල්ඩ් ඇසුවේ ය.

"අපි හැමෝම අපිට ඕනි කරන බඩු ඔක්කොම ගත්තා"

" එතකොට අපේ කැල්වින් වගේම විල්බඩ් ඔයදෙන්නත් ඔයාලගේ බඩු ගත්තනේ ?"

"අපි නං හුඟක් වෙලා ඉඳන් ඒ ඔක්කොම ලෑස්ති කරලා තිබ්බෙ ඩොනල්ඩ් " මේ මිතුර මිතුරියන්ගේ හඬයි.

"පුතාල එහෙනම් පරිස්සමට ගිහින් එන්න ඕනේ"

"ඒක ඇත්ත කිසිම කරදරයක් නොවේවා කියලා පතනවා"

මේ ආත්තම්මලා දෙදෙනාගේ හඬයි.

"හරි එහෙනම් අම්මලා පරෙස්සමට ගෙදරට වෙලා ඉන්න අපි ඉක්මනින් එන්නම්."

"ඔව් අම්මෙ මොකක් හරි හදිස්සියක් උනත් ඉක්මනටම පණිවිඩයක් දෙන්න."

"මම බෑග් ඔක්කොම කැබ් එකට දාගත්තා.එහෙනම් දැන් ඔක්කොමලම අත්තම්මලාට සමුදිලා වාහනයට නැංගනාම් හොඳයි."

මේ ජෝන් සහ එලීනා දෙමාපියන්ගේ හඬයි.

වාහනයට නැගගත් සියල්ලෝම, ආත්තම්මලාට අත වැණුහ.ආතම්මලාත් පෙරළා අත වැනූ පසු සියල්ලෝම සතුටින් ගමන ආරම්භ කළහ.පැයක් පමණ රථයෙන් ගමන් කළ ඔවුන් එක්තරා තැනක නැවතුනේ එය බීවර් ගුහා තිබෙන ස්ථානයක් යැයි ජෝන් මහතා පැවසීමෙන් පසුවයි. ඇත්තෙන්ම එතන තිබුණේ පීවර් ගුහාවක් යැයි ළමයින්ට සිතා ගැනීමට නොහැකි විය.එයට හේතුව බීබර් ගුහා පිහිටා තිබුනේ ලස්සන පොකුරක් මැද වීමයි.යි හිරු එළිය චමත්කාරජනක

ආකාරයට පුංචි පොකුණු මතට වැටී තිබුණි.ඒ මැද පුංචි ලී කෝටුවලින් සකසුණු කුමක් හෝ පාරුවක් වැනි දෙයක් තිබෙනවා සියල්ලන්ටම දැකගත හැකි විය.ජෝන් මහතා පැවසූ අයුරින් ඒ තමයි බීවර් ගුහාව.තව ටිකක් ළං වී බැලීමට අවසර ලැබුණු පසු ළමයි කෙමෙන් කෙමෙන් පොකුණ වෙත ළං වූහ.කුමක් හෝ සිහින් ශබ්දයක්! ජල දියබුම් ගසන ශබ්දයක්! ඔවුන්ට ඇසෙන්නට විය.කෙමෙන් කෙමෙන් පොකුණනට ලං වූ විට,ලී කොටයක් උඩට නැග ලිස්සා වතුරට පනිමින් සෙල්ලම් කරන බීවර් පැටව් කීප දෙනෙකු ළමුන්ට දැක ගත හැකි විය. සතුට වැඩි වූ මිතුරෝ කෑ ගැසීමට සූදානම් වූවත් සතුන් බිය වෙවී යන බියෙන් නිශ්ශබ්දව මත සිනහවක් පා එය යටපත් කරගත්හ.
අති විශිෂ්ටයි අපූරුයි.දුරදක්නයක් භාවිතයෙන් බීවර් ගුහාව අසලටම ළං වූ

ඔවුන්ගේ නෙතට ගැටුණේ චූටි චූටි කෝටු එකතු කර සාදා තිබුණු ඉතාමත් මනරම්,අපූරු,ක්‍රියාශීලි උත්සාහයක අපූරු ප්‍රතිඵලයක් නෙලාගෙන තිබෙන ගුහාවකි .එයට කෙතරම් බීවර් සතුන් මහන්සි වී තිබෙනවාද කියා සිතන විට ඔවුන්ට ඔවුන්ගේ ගෙවත්ත මතක් වුණි. ගෙදර සිටිනවා නම් අපි මේ වන විට ගෙවත්තේ වැඩ කටයුතු නම් නිරත වන බව ඔවුන්ට සිහි වුණි.මේ මොහොතේ

ආත්තම්මලා කුමක් කරනවා ඇත්ද? ගෙතිම් පාඨශාලාවේ නිසැක වශයෙන්ම ඔවුන් දැන් සිටිය යුතුයි.

ජබ්..ජබ්.. ලබ්…ජබ්… හෝස්… හෝස්…විශාල ශබ්දයක් ඇති කරමින් කුඩා බිවර සතුන් වාගේම විශාල බීවර සතුන් ද සෙල්ලම් කරන ආකාරය සියල්ලන්ගේම නෙතට ගැටුනි.යි කැල්වින්ගෙ පින්තූර එකතුවට බීවර් සතුන්ගේ මේ පින්තූර අළුත්ම එකතුවක් වේවි.එය අපූරු සන්ධ්‍යාවක් විය.මහත් කුසගින්නක් දැනෙන ඔවුන්,තවත් සුළු මොහොතකින් ආහාර රැගෙන පැමිණ බීවර් සතුන් නිරීක්ෂණය කිරීමට සූදානම් වූහ.එලිනා මහත්මිය සහ ආත්තම්මාලා දෙදෙනා සාදා තිබුණු රසවත් ප්‍රණීත ආහාර භුක්ති විඳීමෙන් පසු සියල්ලෝම යළිත් බීවර්ගුහා වෙත පැමිණියහ.ඔහු බීවර් සතුන් ජලය පිහින අයුරු සියල්ලන්ටම දැක ගත හැකි විය.එය දඟකාර පිහිනීමකි.

කෙමෙන් කෙමෙන් සන්ධ්‍යාව පහව ගොස් රාත්‍රය උදාවීමට තිබෙන බව සියල්ලන්ගේම අදහසයි.අදින් බීවර්ලාගේ නිරීක්‍ෂණ කටයුතු නැවැත්වීමට නොහැකියි මන්දයත් මේ බීවර් ගුහා තිබෙන එක් තැනක් පමණයි.

කූඩාරම් තැනීමට සුදුසු තැනිතලාවක් සොයාගෙන යෑමට සියල්ලන්ම රථයට යළිත් නැග ගත්හ. සෙමෙන් කඳු හෙල් අතරින් වගුරු බිම් පසු කරමින් ඉදිරියට ඇදී ගියේ ය.චමත්කාරජනක පරිසරයක්!ඇත්ත වශයෙන්ම විශාල කඳවැටියක්, අපූරු ගංගාවක්,විශාල වනරොදක්,ඒත් සමගම හිර බැසගෙන යන සුන්දර අහසක් සහිත් වූ මේ තැනිතලාව කූඩාරම් ගැසීමට සුදුසුම ස්ථානය බව සියල්ලන්ටම හොඳින් වැටහිණි.

පිරිමි ළමයි එනම් ජෝන් මහතාත් සමග එකතුවී කූඩාරම්ගසන්නට විය.ඒ අතරේ රාත්‍රියට රසවත් ආහාරයක් සකස් කිරීමට පසුබිම සකස් කරමින්

ගැහැණු ළමයි දෙදෙනා එලීනා මහත්මිය සමග කුඩා මුළුතැන් ගෙයක් පසෙකින් සකස් කළහ.එය දුටු සියලු දෙනාගේම සිත් ඒ වෙතම යොමුවී තිබුණි.ඉර බැසගෙන යන ඡායාරූපත්, මේ අපූර්ව තැනිතලාවේ ඡායාරූපත්,මේ දවසේ ගෙවුණු සෑම මොහොතකම ගත් ඡායාරූපත් කැලවින්ගේ පින්තූර එකතුවේ විය.

වෙනදාට වඩා ක්ෂනික ආහාර බොහොමයකින් යුක්ත වූ මේ චාරිකාවේ රාත්‍රී භෝජනය ඉතාමත් ප්‍රණීත විය. ඉන්පසු සියල්ලෝම ගිනි මැලයක් ගසා ඒ වටා හිඳගෙන අද දින සිදුවූ සියලුම සිදුවීම් පිළිබඳව සාරාංශ වශයෙන් කතිකා කළහ.එය හාස්‍යජනක කතිකාවකි. පසුව හෙට දිනයට යාමට සියල්ල සූදානම් කරගත් ඔවුන් ගමන් විඩාව නිසාවෙන්ම ඉක්මනින්ම කූඩාරම් තුනේම නිදාගත්හ.එක් කූඩාරමක පිරිමි ළමයි තුන්දෙනාත්,මිතුරියන් දෙදෙනා සමග එලීනා මහත්මියත්, ජෝන් මහතා එක් අයෙකට පමණක් සිටිය හැකි කුඩා කූඩාරමේත් රාත්‍රියේ නින්දට ගියහ.

# 07.වෘකයන්ගේ ආක්‍රමණය

හිම්දිරියෙන්ම අවදි වූ සියල්ලෝම අසල වූ නීල වර්ණ පැහැති නැවුම් ජල කඳක් ගලා යන ගංගාවෙන් මුහුණ අතපය සෝදා ගත්හ.ඉක්මනින්ම කූඩාරමේ තිබූ සියලුම බඩුව ඇසුරුම් කළ ඔවුන් කූඩාරම් ද හකුලාගෙන යළිත් රථයට නැග ගත්හ.කැබ් රථයෙන් යන අතරතුරදීම උදේ ආහාරය ගත් ඔවුන්,යළිත් බීවර් ගුහා තිබෙන ස්ථානය සොයාගෙන චාරිකාව ආරම්භ කළහ.

ටික දුරක් යාමට මත්තෙන් වාහනය නතර විය.මේ ස්ථානයේත් බේවර් ගුහා කිහිපයක් ම තිබෙන බව ජෝන් මහතගේ අදහසයි.නමුත් කැබ් රථය පිටතින් නැවැත්වීමට සිදුවූයේ බීවර් ගුහා තිබුණු වනාන්තරය විශාල වනාන්තරයක් වූ බැවින් සහ එහි මාර්ගය පටු නිසයි.වාහනයෙන් බැසගත් සියල්ලෝම වනාන්තරය තුළට ඇතුළු විය.

නමුත් පෙරදීවාගේ නොව,ජෝන් මහතා තමන්ගේ ආයුධ කිහිපයකුත් මේ ගමන සඳහා යොදා ගන්නා බව සියල්ලෝම දුටුවෝ ය.ජෝන් මහතා පවසා සිටියේ එසේ ආයුධ ගන්නේ මේ වනාන්තරය බීවර් සතුන් පමණක් නොව තවත් බොහෝ බිහිසුණු සතුන් පවා සිටිය හැකි වීම නිසයි. කෙමෙන් කෙමෙන් වනාන්තරය මධ්‍යම ප්‍රදේශයට ඇතුළු වූ ඔවුහු යම්කිසි ශබ්දයක් ඇසුණු හෙයින් වටපිට බැලූහ.කිසිවක් නොවූහයෙන් යළිත් ගමනාරම්භ කළ ඔවුන්ගේ සිත් තුළ යම් සැකයක් හටගෙන තිබුණි.මහා

ගෙරවිලි හඬක්!සියල්ලම පසෙකට විය. ජෝන් මහතා තමන්ගේ ආයුධයකුත් රැගෙන ඉදිරියට ගමන් කළේ ය.වෘකයන් මේ වනාන්තරයේ සිටින බව ළමෝ පවා දැන සිටියහ.ඒ නිසාවෙන් මදක් බිය වූ ඔවුන් දුටුවේ පඳුරු අස්සෙන් කෙමෙන් කෙමෙන් ඉදිරියට එන වෘකයින්මයි.ජෝන් මහතාගේ සහායට එලීනා මහත්මයත් ආයුධයක් රැගෙන ඉදිරියට යන අතරේ ළමුන් වෙතට වෘකයන් කඩාපැන්නේ ය.ජෝන් මහතාගේ අනපරිදි මිතුරෝ වනාන්තරයේ ඔවුන් නොදන්නා පැත්තකට දිව ගියහ.යි මඳක් නිවහල් ස්ථානයක් සම වෙනතුරු ඔවුහු දිව ගියහ. නොදැනුවත්වම වනාන්තරයේ මධ්‍යයටම ඇතුළු වී සිටි ළමයි මඳක් තැතිගත්හ.මන්දයත් දෙමාපියන් දෙදෙනාම වෙනත් පැත්තක ඔවුන් දෙමව්පියන්ගෙන් වෙන්වීලා.

දැන් කිසිවක් කිරීමට නොහැකි ය.අවුරුදු පහළොවක් වන ඩොනල්ඩ් පවා මේ මොහොතේ නම් බිය වූවේය. කුඩා කාලයේ පටන් ම පුහුණු කඳවුරු සඳහා සහභාගී වී සිටි ළමයි ,මෙවැනි අවස්ථාවකදී සිදු කළ යුත්තේ කුමක්දැයි හොඳින්ම දැන සිටියහ. තවත් මදක් දුර ඈතට ඇවිද ගිය ඔවුන්ට නීල වර්ණ පැහැති ජලය ගලා යන නැවුම් ගංගාවක් යළිත් හමුවිය.මේ ගඟේ ජලය ඔවුන්ට මතකය.නමුත් මේ ගඟේ එක් වෙනම කොටසකි.

" කැල්වින් ඔයා ළඟ සිතියමක් තිබුණා නේද?,මට මතක ඒක ඔයා ළඟ තිබුනා කියලා.ඉක්මනට බලන්න බෑග් එක ඇතුලේ එක ඇති!"මේ මදක් තැතිගත් ස්වභාවයකින් කතා කර සිටි ඩොනල්ඩ්ගේ හඬයි.
"ඇත්තටම මේකෙ සිතියමක්! ඉන්න මම ටක්ගාලා බලන්නම්"මේ වැඩිමල් සොහොයුරාගේ අණට කීකරු වන කැල්වින්ගේ හඬයි.
"ඩොනල්ඩ් මගේ ළඟත් සිතියමක් තිබුණා...!"මේ අපේ විල්බර්ට්ගේ හඬයි.
කැල්වින් සහ විල්බර්ට් ඔවුන්ගේ බෑග් වල තිබුණු සිතියම් එළියට ගත්හ.ඉන්පසු
සිතියම් කියවීමේ අපූරු දක්ෂතාවක් තිබූ ඩොනල්ඩ් සිතියම් දෙකම ඔවුන්ගෙන් ලබා ගත්තේය.
"මට මේ සිතියම් කියවන්න පුළුවන්."මඳ සිනහවක් ද සමගින් ඩොනල්ඩ් පැවසුවේය.
"ඇත්තටම ඒක නම් නියමයි ඩොනල්ඩ්!"මේ වදන් එකවරම පැවසුවේ මෙතෙක් වෙලා බියෙන් තැතිගෙන නිහඬව සිටි ෆියෝනා සහ ලුවී යි.
සිතියම් පැහැදිලි බව ඩොනල්ඩ්ට සිතියම් අතට ගත් මොහොතේම වඩාත් හොඳින් වැටහිණි.

"අපිට ආයෙත් ගෙදර යන්න පුළුවන් ළමයි!"ආඩම්බර ලීලාවෙන් තම මිතුර මිතුරියන් දෙස බැලූ ඩොනල්ඩ් පැවසුවේය. සිතියම හකුලාගත් ඔහු ,"දැන් හුඟක් හවස් වෙලා. තව ටිකකින් රෑ වෙනවා.අපිට මෙහෙ නවතින්න වෙනවා. අපිට මේ හුඟක් රෑ වෙලා එහෙට මෙහෙට ඇවිදින්න පුළුවන් කැලෑවක් නෙවෙයි."

සියල්ලන්ගෙම මුහුණේ අමුතු ප්‍රබෝධමත් සිනහක්වක් ඇති විය.සියල්ලෝම ඩොනල්ඩ් එනම් ඔවුන්ගේ වැඩිමල්ම මිතුරාගේ බසට අවනත වූහ.කඳවුරු බොහොමයකට සහභාගිවී පුරුදලත් ඔවුන්,කූඩාරමක් තනා ගන්නා අයුරු හොඳින්ම දැන සිටියහ.ඩොනල්ඩ්ගේ සහ කැල්වින්ගේ බෑග් වල ඔවුන්ට විශේෂිතයාගයක් වශයෙන් හමුවුණු කූඩාරම් දෙකක් විය.එහි විශේෂත්වය වූයේ ඕනෑම මොහොතක හකුලා ගැනීමටත්, ඕනෑම මොහොතක එය යළි දිගහැරීමටත් හැකි වන පරිදි එය අපූරු විශාල අයුරින් සකස් කර තිබීමයි.ඔවුන් දැන් සිටින්නේ ගඟ අසබඩයි.එය සූර්යයා බැහැගෙන යන සුන්දර මොහොතක සන්ධ්‍යාවක් ගත කිරීමට හැකිවන පරිදි සකසා තිබූ ස්ථානයක් වැනිය.එයින් කම් නොවේ. සියලු දෙනාම තම තමන්ගේ බඩුමොට්ටු කූඩාරම් ඇතුලෙන් තැබූහ.මෙතරම් අභියෝගාත්මක මොහොතක් ඔවුන් ගතකර සිටියත් කැල්වින් ඔහුගේ පින්තූර එකතුවට අලුත් පින්තූරද මේ මොහොතේ එකතු කළේ ය.

'රාත්‍රී ආහාරය ගැනීමට හැකිනම්!' ඔවුන්ට සිතිණි.බියවීමට කිසිදු හේතුවක් නැති බව ඔවුන්ට වැටහුණි.එයට හේතුව ඔවුන්ට කෙටි ආහාර සහිත ක්ෂණික ආහාර පැකට් එක බෑගින් තිබුණු නිසයි.එහි තිබූ ආහාර කුඩා ගිනි මැලයක් ගසා ගැනීමෙන් පසු මදක් පුළුස්සා ඔවුන් ආහාරයට ගත්හ.

වෙනදා මෙන් එය ප්‍රීතිමත් ප්‍රණීත ආහාරයක් නොවූවත් මේ මොහොතේ නම් ඔවුන්ට එය ඉතාමත් රසවත් ආහාරයක් විය.

අපට වටපිට බැලූ පසු ඔවුන්ට වැටහුණේ මේ මොහොතේ නම් කිසිදු අනතුරක් සිදු නොවිය හැකි බවයි.කිසිදු සත්වයෙක් මේ වැනි ස්ථානයකට නොපැමිණෙන බව ඔවුන්ගේ අදහසයි.සැබැවක් මෙවැනි ස්ථානයකට කිසිදු සත්වයෙක් පැමිණෙන්නේ නැහැ.

එකවරම නිවස මතක් හෝ ඔවුන්ට සිහි වූයේ දෙමාපියන් මේ මොහොතේ හත් පරිශ්‍රමයක් දරනු ඇති බවයි. සැදීමට ගිය ගෙවත්ත!එයට කුමක් වෙලාද? දින දෙකක් ගතවෙලා.මේ සියල්ල එකිනෙකාගේ සිත් තුළට දැනෙන විට මහත් වේදනාවක් සහ තනිකමක් ඔවුන්ට දැනුණි. නමුත් ඔවුන් එකට සිටීම නිසා ඔවුන්ට එය ඒ තරම්ම දරා ගැනීමට අපහසු වූයේ නැහැ.මේ සියල්ල සිතට නැගෙන විට ඒක කූඩාරමක පිරිමි ළමයි තුන්දෙනාත්,එයටම අනුබද්ධව සැකසුණු තවත් ටිකක් කුඩා කූඩාරමක ගැහැණු ළමයි දෙදෙනාත් නින්දට ගියහ.බොහෝ වේලාවක් යනතුරු අවදිව සිටි නමුත් අද දින සිදුවූ විඩාබර භයානක වේදනාකාරී සිදුවීම්වල මතක යන අතරේ ඔවුන්ට අසහනකාරී නින්දකට යන්නට විය.

නමුත් සියල්ලෝම සුළු මොහොතකින් තද නින්දකට වැටුණි.



# 08.මිතුරන්ගේ පළමු වික්‍රමය

එකටම අවදි වූ සියල්ලෝම අසරින් ගලා බසින නීල පැහැති ගංගාවෙන් මුහුණ සෝදාගෙන,එහි තිබුණු තමන්ගේ වඩමුට්ටු සියල්ල එකතු කරගෙන කූඩාරමත් හැකිලූහ.ඉන්පසු උදේ ආහාරයට ගැනීමට කුමක් හෝ තිබෙනවාදැයි සොයා බලා ඔවුන් චොක්ලට් ඉන් එකක් ආහාරයට ගත්හ.උදෑසනට සුදුසු නොවන ආහාරයක් වුවත් කිරීමට කිසිවක් නොමැති හෙයින් එය ඔවුන් ආහාරයට ගත්හ.

ඉන්පසු යළිත් සිතියම දිගහැර බැලූ ඩොනල්ඩ් වටහා ගත්තේ මේ ඝන කැලෑව තරණය කළ හැක්කේ,ඔවුන්ට මේ දිස්වන ගඟ හරහා පමණක් බවයි.ගඟ දිගේ ඉහළට යන විට ඔවුන්ට ඔවුන් කලින් සිටි නවාතැන කරා යාමට හැකි බව ඔහු වටහා ගත්තේය.නමුත් ගංගාව හරහා යාමට තිබෙන ගොඩබිම් මාර්ගය එතරම් ගමන් කිරීමට සුදුසු මාර්ගයක් නොවන බව ඔහු වටහා ගත්තේය.එයට හේතුව කලින් සිටි දරුණු සතුන් වාගේම පටු මාර්ගයක් මෙහි තිබෙන නිසයි.එහේ ඔහු කල්පනා කරේ ගඟ දිගේ යෑමට පාරුවක් සාදා ගැනීම සුදුසු බවයි.එක්වරම ඔහුගේ සිහියට ආවේ ඔවුන් මෙම තැනිතලාවේ මෙම ගඟ අසබඩට පැමිණෙන විට ඔවුන් දුටු ලී ගොඩයි.නමුත් ඒ ස්ථිර වශයෙන්ම එතන තිබුණාදැයි කීමට නොහැකි නිසා ඩොනල්ඩ් ඒ ස්ථිර දැනගැනීම සඳහා,
"ළමයිනේ ඔයාලට මතකද අපි මේ ආපු ගමනේ.... කොහෙම හරි තැනක ලී ගොඩක් තිබුණා?" යැයි ඔහු මිතුරන්ගෙන් ඇසුවේය.

"ඔව් ඇත්තටම තිබුණා මට මතකයි .... ඒක තිබුණේ අර පුංචි පොකුණක් තිබ්ච්ච තැනක!"වහාම මෙම පිළිතුරු ලැබුණේ ලුවිගෙනි.
"බොහොම හොඳයි ලුවි"ඩොනල්ඩ් පැවසුවේය.

සියලුම මිතුරන් එකතු කරගත් ඩොනල්ඩ් කැලෑව තුළට යළිත් යන්නට විය.

නොබෝ වේලාවකින් ඔවුන්ට ලීගොඩ තිබූ ස්ථානය හමුවිය.

ඩොනල්ඩ් පැවසුවේ නැහැ තමන් කුමක් කිරීමට යාවිද කියා.නමුත් මිතුරන්ට වැටහුනා ඔහු කුමක්ද කිරීමට යන්නේ කියා. මිතුරන් එක්ව එතන තිබූ ලී කුඩා කුඩා ගොඩවල් බැගින් එකිනෙකාගේ දෑත් වලට ගත්හ.ඉන්පසු එතන තිබූ ලී ගොඩ හිස්විය.යළිත් ඔවුන් ඊයේ දෙන නවාගත් ස්ථානයට ස්ථානයට පැමිණි ඔවුන් කතිකා කරගත්තේ පාරුවකුත් හබල් දෙකකුත් සෑදීමටය.ඒ සඳහා ඔවුන්ගේ මේ ලී හොඳටම ප්‍රමාණවත්ය.

හබල් දෙකක් සෑදීමට තිබෙන නිසා එම හබල් දෙක සෑදීමට බාරගත්තේ කැල්වින් සහ විල්බර්ට් ය.ලූවි සහ හියෝනා පාරුව සෑදීමට ඩොනල්ඩ් ට උදව් කළහ.සුළු මොහොතක් ගත වීමට මත්තෙන් ඔවුන් ලණු සහ ඔවුන් සතුව තිබුණු ඇණ යොදා ගනිමින් අගනා පාරුවක් සහ ලබා දෙකක් සාදා අවසන් කළහ.ඉන්පසු පාරුව ගඟට තල්ලු කළ ඔවුන් තමන්ගේ බඩුමුට්ටු සියල්ලත් පාරුවට පටවාගෙන ඔවුන්ද පාරුවට නැඟ ගමන ආරම්භ කළේ හබල් දෙක යොදා ගනිමිනි.පැය භාගයක් පමණ යාත්‍රා කළ ඔවුන්ට ඔවුන් දෙමව්පියන් සමඟ පෙරදා දිනක රාත්‍රී නවාතැන් ගත් අපූරු ස්ථානය හමුවිය.මද සතුටක් ඇති වූ ඔවුන් පාරුවෙන් බැස පාරුව පසෙකට කළහ.ඉන්පසු පයින්ම ගමන ආරම්භ කළහ.

සිතියම යොදා ගනිමින් ඔවුන්ට නගරයට යාබදව පිහිටි ජෝන් මහතාගේ පරණ පශු වෛද්‍ය කාර්යාලය හමුවිය.එයින් මහත් සතුටක් දැනුණු ඔවුන්ට යළිත් සිතියමක් අවශ්‍ය නොවීය.වටපිට බලමින් නගරය වෙතට කෙමෙන් කෙමෙන් ඇවිද යන්නට විය.නොබෝවේලාවකින්ම නගරයේ පිවිසුම් දොරටුව වෙතට ඔවුන් ගමන් කළහ.වේගයෙන් තමන්ගේ නිවස වෙත දුව ගිය ඔවුන්ට නිවස දැක ගැනීමට හැකි විය.නිවසේ ගේට්ටුව වේගයෙන්

හැරගෙන ඇතුලට පැමිණි ඔවුන්ට දිස් වූයේ ජෝන් මහතාත් එලීනා මහත්මියත් කැල්වින්ලාගේ දෙමව්පියන්ටත් කතා කර, පශු වෛද්‍ය කාර්යාලයේ නිලධාරීන්ටත් කතාකර,

විශේෂයෙන්ම පොලිසියටත් කතා කර ඔවුන් සොයා යෑමට විශේෂ මෙහෙයුමක් ආරම්භ කිරීමට සූදානම් වන බවයි.නමුත් මේ සියල්ලම ඇනහිටිනි.එයට හේතුව අපේ මේ වීර මිතුරන් ඔවුන්ගේ නිවසට තනිවම පැමිණ සිටීමයි.තරාගත නොහැකි වූ සතුටක් දැනුණු දෙමාපියෝ දරුවන් වෙත දිව ඇවිත් ඔවුන්ව වැලඳගත්හ.සියල්ලන්ගේම නෙත් තුළ සතුටු කඳුළු වැගිරෙන්නට විය.නිවස ඇතුලත ඉතාමත් ශෝකයෙන් කල් ගෙවූ ආත්තම්මලා දෙදෙනාත් කඩිමුඩියේ දරුවන් වෙත පැමිණියහ.ආතම්මලා දෙදෙනා දරුවන්ව ආදරයෙන් වැළඳ ගත්හ.

මේ අපේ බීවර් ගුහා චාරිකාවේ අවසානයයි.

අලුත් සාමාජිකයකුත් සමඟ මේ වීර දරුවන් පස්දෙනාගේ අපූරු තවත් කතාවක් සමග හමුවෙමු!...

## විල්බර්ට් සතුව තිබු සිතියම



ලූවී





විල්බර්ට

ගෙවත්ත සෑදීමට නියමිතව තිබූ ස්ථානය අසල ඇති

පොකුණ



මිතුරන් ගෙවත්ත සෑදීමට ආරම්භ කිරීමෙන් පසු



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වු මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01